**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

*******

## පුවත්පත් නිවේදනය

## මහනුවරින් නර්තන කණ්ඩායමක් ඉන්දියාවේ ජාතික ගෝත්‍රික නර්තන උළෙලට සහභාගී වේ

ඉන්දියාවේ චට්ටිස්ගාර් ප්‍රාන්තයේ පැවති ජාතික ගෝත්‍රික නර්තන උළෙල – 2019 සඳහා මහනුවර සිට ශ්‍රී සත්‍ය සායි කලායතනයේ අධ්‍යක්ෂ උමා ශ්‍රීධරන් මහත්මියගේ නායකත්වයෙන් යුත් 12 දෙනෙකුගෙන් යුත් නර්තන කණ්ඩායමක් සහභාගී විය.

ශ්‍රී ලංකාවේ විවිධ ස්වදේශික නැටුම් ප්‍රදර්ශනය කරමින් නර්තන කණ්ඩායම ප්‍රේක්ෂකයින් ආමන්දානන්දයට පත් කළේය. නර්තන උළෙල 2019 දෙසැම්බර් 27 සිට 29 දක්වා දින 3ක් පුරා පැවැත්විණි. පළමු දින වූ 2019 දෙසැම්බර් 27 වන දින ඔවුන් කළගෙඩි නැටුම හා අස්වනු නැටුම ඉදිරිපත් කළහ. ඊළඟ දවසේ ඔවුන් රබන් නැටුම හා කඩු නැටුම ඉදිරිපත් කළ අතර, තෙවන මෙන්ම අවසාන දිනයේදී ඔවුන් මොණර නැටුම ඉදිරිපත් කළහ.

මෙම නර්තන කණ්ඩායමට අනුග්‍රහය දැක්වූයේ චට්ටිස්ගාර් ප්‍රාන්ත රජය සහ ඉන්දියානු සංස්කෘතික සබඳතා කවුන්සිලය විසිනි. මෙම කණ්ඩායම චට්ටිස්ගාර් ප්‍රාන්තයේ මහ ඇමති භූපේෂ් බාගෙල් මහතා හමුවූ අතර ඔහු එම අවස්ථාවේදී සහතික සහ සිහිවටන ප්‍රදානය කළේය.

2019 ජාතික ගෝත්‍රික නර්තන උළෙල සඳහා ඉන්දියාවේ සෑම ප්‍රාන්තයකින්ම සහ ශ්‍රී ලංකාව, මාලදිවයින, බංග්ලාදේශය, බෙලාරුස්, තායිලන්තය සහ

උගන්ඩාව යන රටවලින් නර්තන කණ්ඩායම 80 කින් 1200 කට අධික පිරිසක් සහභාගී වූහ.

****

කොළඹ

2020 ජනවාරි 6